අයවැය කාරක සභා අවස්ථා විවාදය - 2019

குழு நிலை விவாதம் - 2019

Committee Stage Debate - 2019

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
ප්‍රගති වාර්තාව - 2018

முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
முன்னேற்ற அறிக்கை - 2018

DEPARTMENT OF MANAGEMENT AUDIT
Progress Report - 2018

මහලේකම් කාර්යාලය	செயலகம்	The Secretariat
කොළඹ 01.	கொழும்பு 01.	Colombo 01.

පටුන

පිටු අංකය

01. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු හා කාර්යයන් 01

1.1. හැඳින්වීම 01

1.2. දැක්ම 01

1.3. මෙහෙවර 01

1.4. අරමුණු 01

1.5. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන් 02

1.6. දෙපාර්තමේන්තුව ලබා ඇති ඇගයීම් හා සම්මාන 02

02. මූල්‍ය පරිපාලනය 03

03. භෞතික කාර්ය සාධනය 05

3.1 රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම 05

3.2 විගණන හා කළමනාකරණ කමිටු සඳහා නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම 06

3.3 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත මහා භාණ්ඩාගාර වාර්තා ඉදිරිපත් කිරීම සහ එම රැස්වීම්වලට සහභාගී වීම 07

3.4 රාජ්‍ය අංශයෙහි අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය කිරීම හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම. 08

3.5 සංවර්ධන ව්‍යාපෘතිවල කළමනාකරණ විගණනය ශක්තිමත් කිරීම 10

3.6 විශේෂ විමර්ශන හා විගණන කටයුතු 12

04. මානව සම්පත් සංවර්ධනය හා සාමාන්‍ය පරිපාලනය 16

4.1 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 16

4.2 2018.12.31 දිනට කාර්ය මණ්ඩලය 17

4.3 2018 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු 18

4.3.1 2018 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා 18

4.3.2 2018 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා 20

05. 2019 වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම් 22

01. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැක්ම , මෙහෙවර , අරමුණු හා කාර්යයන්

1.1 හැඳින්වීම

2008.01.25 දිනැති අංක 08/0200/306/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස 2008.02.01 දින ස්ථාපනය කර ඇත.

තව ද මෙම දෙපාර්තමේන්තුව 2017.06.09 දිනැති අංක 2022/34 ගැසට් පත්‍රයෙන් ජනාධිපති කාර්යාලය යටතට පත්ව ඇති අතර, 2018.05.12 දිනැති අංක 2070/56 දරණ ගැසට් පත්‍රය අනුව නැවත මුදල් අමාත්‍යාංශය යටතට පත් වී ඇත.

1.2 දැක්ම

ඉහළම කාර්ය සාධනයකින් හා වගවීමකින් යුත් රාජ්‍ය සේවයක් උදෙසා වටිනාකම් එකතු කරන විශිෂ්ඨතම කළමනාකරණ විගණන කොටස්කරු බවට පත්වීම.

1.3 මෙහෙවර

රාජ්‍ය අංශයේ සංවිධානවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම මඟින් අපේක්ෂිත කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස සහාය සහ මාර්ගෝපදේශ සැපයීම.

1.4 අරමුණු

1. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනයෙහි ඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා දායකවීම.
2. විගණන හා කළමනාකරණ කමිටු මඟින් අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.
3. අභ්‍යන්තර විගණනය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ හඳුන්වා දීම.
4. සංවර්ධන ව්‍යාපෘතීන්හී කළමනාකරණ විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
5. විශේෂ විමර්ශන කටයුතු තුළින් රාජ්‍ය අංශයේ සිදුවන හා සිදුවිය හැකි අක්‍රමිකතා අනාවරණය කිරීම හා එවැනි තත්ත්වයන් හා සිදුවීම් වළක්වා ගැනීමට නිර්දේශයන් සහ නිවාරණ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

1.5 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්යයන්

ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් හා ගණන්දීමේ නිලධාරින්ට අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර ගෙන යාමට සහයෝගය ලබා දීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වන අතර, ඒ අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් කාර්යයන් මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ.

1. අභ්‍යන්තර විගණනයේ ගුණාත්මකභාවය හා කාර්යක්‍ෂමතාවය ඉහළ නැංවීම සඳහා මූලික ආයතනය ලෙස කටයුතු කිරීම.
2. අභ්‍යන්තර විගණනය සඳහා මාර්ගෝපදේශ හඳුන්වාදීම.
3. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කිරීම.
4. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියෝජනය කිරීම හා ඊට අදාළ මඟපෙන්වීම් ලබා දීම.
5. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ භාණ්ඩාගාර වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම.
6. රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය කිරීම සහ අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යසාධනය ඇගයීම.
7. අමාත්‍යාංශ යටතේ ඇති සංවර්ධන ව්‍යාපෘති කළමනාකරණ විගණනය අධීක්ෂණය කිරීම.
8. විශේෂ විමර්ශන හා විශේෂ විගණන කටයුතු සිදුකිරීම.

1.6 දෙපාර්තමේන්තුව ලබා ඇති ඇගයීම් හා සම්මාන

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණයට යටත් වන ආයතනයන්හි මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ ඇගයීම සඳහා වන සම්මාන පිරිනැමීමේදී 2016 මුදල් වර්ෂය වෙනුවෙන් මූල්‍ය ආයතන කළමනාකරණය සහ රාජ්‍ය ආයතනයන්හි කාර්යසාධනය පිළිබඳ ඉහළ මට්ටමේ ක්‍රියාකාරී මට්ටමකට ළඟාවීමට සමත් වූ රාජ්‍ය ආයතන අතරට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව පත්වීම හේතුවෙන් 2018 අගෝස්තු 28 වන දින රන් සම්මානයෙන් පිදුම් ලබන ලදී.

02. මූල්‍ය පරිපාලනය

2018 අයවැය ඇස්තමේන්තුව මඟින් වැය ශීර්ෂ 324 වැඩසටහන අංක 01 ව්‍යාපෘතිය - අංක 01 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබිණි.

2018.12.31 දින දක්වා එම ප්‍රතිපාදන වැය කළ ආකාරය පහත දැක්වේ.

වියදම් විස්තරය	වාර්ෂික අයවැය වෙන් කිරීම	පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම	මු.රෙ. 66 හා 69 අනුව මාරු කිරීම්/අමතර ප්‍රතිපාදන වෙන්කිරීම (රු.)	මුළු ශුද්ධ වෙන්කිරීම් (රු.)	තත්‍ය වියදම (රු.)	ඉතිරිය (රු.)
පුනරාවර්තන වියදම් (අ)	**49,050,000**	**480,000**	**-**	**49,530,000**	**45,934,890**	**3,595,110**
පුද්ගල පඩිනඩි	35,210,000		(210,000)	35,000,000	31,922,902	3,077,098
අනෙකුත් වියදම්	13,840,000	480,000	210,000	14,530,000	14,011,988	518,012
මූලධන වියදම් (ආ)	**3,400,000**	**-**	**-**	**3,400,000**	**3,216,136**	**183,864**
2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	100,000		143,138	243,138	243,138	-
2003 වාහන	300,000			300,000	162,157	137,843
2103 යන්ත්‍ර හා උපකරණ	500,000		(143,138)	356,862	356,859	4
2401 හැකියා වර්ධනය	2,500,000			2,500,000	2,453,983	46,017
මුළු එකතුව (අ) + (ආ)	**52,450,000**	**480,000**	**-**	**52,930,000**	**49,151,026**	**3,778,974**



රජයේ නිලධරයන්ගේ අත්තිකාරම් ‘බී ’ ගිණුම

2018 වර්ෂය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ අනුමත අත්තිකාරම් ‘බී ’ගිණුමේ විස්තර පහත දැක්වේ.

විස්තරය	අනුමත සීමාව (රු.)	තත්‍ය වියදම (රු.)
උපරිම වියදම් සීමාව	4,500,000	3,659,455.40
අවම ලැබීම් සීමාව	2,150,000	2,161,549.56
උපරිම හර ශේෂ සීමාව	10,000,000	9,173,834.52

03. භෞතික කාර්ය සාධනය

3.1 අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හැකියා වර්ධනය කිරීම

අභ්‍යන්තර විගණනයෙන් අපේක්ෂිත පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා දෙපාර්තමේන්තුවල සේවයේ නියුක්තව සිටින අභ්‍යන්තර විගණකවරුන්, අභ්‍යන්තර විගණන අංශවල සංවර්ධන නිලධාරීන් සහ රාජ්‍ය කළමනාකරණ සහකාරවරුන්ගේ විෂය දැනුම ඉහළ නැංවීමට හා විගණනය පිළිබඳව කාලීන තොරතුරු ලබාදීමට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නිරතුරුවම කටයුතු කරයි.

උක්ත අරමුණ සහිතව 2018.12.31 දින දක්වා මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැඩමුළු පවත්වන ලදී.

පැවැත්වූ දිනය	වැඩමුළුවේ මාතෘකාව	ඉලක්කගත කණ්ඩායම
2018.03.07 සහ 08	අභ්‍යන්තර විගණන අංශවල සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩමුළුව	මාතර, හම්බන්තොට, ගාල්ල, මොණරාගල බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණන අංශ කාර්ය මණ්ඩලය
2018.03.19 සහ 20	අභ්‍යන්තර විගණන අංශවල සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩමුළුව	අනුරාධපුර, පුත්තලම, පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණන අංශ කාර්ය මණ්ඩලය
2018.05.11	2017 අංක 24 දරන දේශීය ආදායම් පනත පිළිබඳ පුහුණු වැඩමුළුව	ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, කොමිෂන් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා අභ්‍යන්තර විගණන ඒකකවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන්
2018.06.13	අභ්‍යන්තර විගණනයේ වර්තමාන නැඹුරුතාවය සහ එහි ස්වභාවය පිළිබඳ පුහුණු වැඩමුළුව	ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, කොමිෂන් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා අභ්‍යන්තර විගණන ඒකකවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන්

2018.08.30	2018 අංක 19 දරන ජාතික විගණන පනත පිළිබඳ පුහුණු වැඩමුළුව	ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, කොමිෂන් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා අභ්‍යන්තර විගණන ඒකකවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන්
2018.11.15	සිගාස් වැඩසටහන පිළිබඳ පුහුණු වැඩමුළුව	ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, කොමිෂන් සභා, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා අභ්‍යන්තර විගණන ඒකකවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් සහ අභ්‍යන්තර විගණකවරුන්
2018.12.20	අභ්‍යන්තර විගණන අංශවල සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩමුළුව	කළුතර, ගම්පහ, කොළඹ, රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණන අංශ කාර්යමණ්ඩලය

3.2 විගණන හා කළමනාකරණ කමිටු සඳහා භාණ්ඩාගාර නියෝජනය මගින් රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති DMA/2009(1) හා 2009.06.09 දිනැති චක්‍රලේඛයේ සඳහන් පරිදි රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වර්ෂයකට 04 ක් පැවැත්විය යුතු අතර, ආදායම් ලබන දෙපාර්තමේන්තු අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06ක් පැවැත්විය යුතු වේ. මේ සඳහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරියෙකු කමිටු සාමාජිකයෙකු වශයෙන් සහභාගී වේ. 2018 වර්ෂයේ සියළුම අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, විශේෂ වියදම් ඒකක හා තෝරාගත් ආදායම් සහ අනෙකුත් දෙපාර්තමේන්තු සඳහාත් මෙම දෙපාර්තමෙන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ අතර, ඒ පිළිබඳ විස්තර පහතින් පෙන්වා ඇත. එම නිලධාරීන් විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ඵලදායීව හා අඛණ්ඩව පැවැත්වීම පිළිබඳ මගපෙන්වීම් සිදු කිරීම හා අධීක්ෂණය කිරීම් සිදුකර ඇත. එමෙන්ම අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක ශක්තිමත් කිරීමටත්, අභ්‍යන්තර විගණන වාර්තා හා රජයේ විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති විශේෂ කරුණු සම්බන්ධව තීරණ ගැනීමේදී අවශ්‍ය උපදෙස් ලබාදීමටත් කටයුතු කර ඇත. තවද කමිටු තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීම මඟින් රාජ්‍ය අංශයේ කළමනාකරණ කටයුතු ශක්තිමත් කිරීමට දායකත්වය සපයා ඇත.

කළමනාකරණ විගණන චක්‍රලේඛ විධිවිධාන අනුව 2018.12.31 දිනට පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	ආයතනය	සංඛ්‍යාව	සහභාගී වූ රැස්වීම් ගණන
1.	අමාත්‍යාංශ	43	167
2.	දිස්ත්‍රික් ලේකම් කාර්යාල	25	79
3.	ආදායම් දෙපාර්තමේන්තු (මුදල් අමාත්‍යාංශය යටතේ වූ)	4	21
4.	අනිකුත් දෙපාර්තමේන්තු	29	65
5.	විශේෂ වියදම් ඒකක	10	27

3.3 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත මහා භාණ්ඩාගාර වාර්තාව ඉදිරිපත් කිරීම සහ එම රැස්වීම්වලට සහභාගී වීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා පළාත් පාලන ආයතන කැඳවීම් කරනු ලබන අවස්ථාවලදී, ඒ සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව නියෝජනය කිරීමත්, මහා භාණ්ඩාගාර වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කිරීමත් මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි.

ඒ අනුව 2018.12.31 දින වන විට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීම සඳහා සහභාගීත්වය පහත පරිදිය.

අනු අංකය	ආයතනය	සහභාගී වූ රැස්වීම් ගණන
1.	අමාත්‍යාංශ	05
2.	දෙපාර්තමේන්තු	09
3.	පළාත් සභා හා පළාත් පාලන ආයතන	04
4.	දිස්ත්‍රික් ලේකම් කාර්යාල	01
5.	වෙනත්	01
එකතුව		**20**

3.4 රාජ්‍ය අංශයෙහි අභ්‍යන්තර විගණන ඒකක සම්බන්ධීකරණය කිරීම හා අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම.

➢ **<u>අමාත්‍යාංශ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය - 2017/18</u>**

අභ්‍යන්තර විගණනයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම තුළින් රාජ්‍ය අංශය තුළ ඵලදායි හා කාර්යක්ෂම අභ්‍යන්තර විගණනයක් පවත්වා ගෙන යාමේ අරමුණින් 2017 වර්ෂයේ අවසාන කාර්තුව තුළදී ආරම්භ කරන ලද අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ සමාලෝචනය එම වර්ෂය තුළදී සම්පූර්ණ කිරීමට නොහැකි වූ අමාත්‍යාංශ 05ක් සඳහා අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචන සිදු කරන ලදී.

සමාලෝචනය තුළින් මතු වූ කරුණු අනුව,

- අභ්‍යන්තර විගණන ඒකකවල කාර්යසාධනය වැඩි දියුණු කිරීම සඳහා අදාළ නිර්දේශ ඇතුළත් කරමින් වාර්තාවක් සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත ඉදිරිපත් කිරීම.
- වාර්ෂික විගණන සැලැස්ම පිළියෙළ කිරීමේදී ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන්ට ප්‍රමුඛතාවය ලබා දීම හා ඒ අනුව විගණනය කිරීමත් විගණන හා කළමනාකරණ කමිටු න්‍යාය පත්‍රය වැඩි දියුණු කිරීමත් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම.

සිදු කරන ලදී.

➢ **<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය.</u>**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාල 24කට අදාළව 2018 වර්ෂයේදී සිදු කරන ලද අතර, ඒවායේ විගණන කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සඳහා සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් වෙත නිරීක්ෂණ හා නිර්දේශ ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ඇත. සමාලෝචනයෙන් මතු වූ කරුණු අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල විගණන කටයුතු සිදු කිරීමේදී ප්‍රධාන අභ්‍යන්තර විගණකවරු මුහුණ දෙන ගැටළු සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු කරුණු මෙන්ම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් අතර දැනුම හුවමාරු කර ගැනීම සඳහා ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන්වලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අදාළව සිදු කළ යුතු කරුණු ඇතුළත්ව වාර්තාවක් අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ලේකම් කාර්යාල) වෙත ඉදිරිපත් කර ඇත.

➢ අමාත්‍යාංශ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය - 2018

2017 වර්ෂයේදී ආරම්භ කරන ලද අමාත්‍යාංශ පිළිබඳ සමාලෝචනය සැලකිල්ලට ගනිමින් හා එම කටයුතු තවදුරටත් පුළුල් කරමින් අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුද සමඟින් සමාලෝචනය සිදු කිරීම 2018 අවසාන කාර්තුව තුළදී ආරම්භ කරන ලදී.

2018 වර්ෂයේ අග භාගයේදී අවස්ථා කිහිපයකදීම අමාත්‍යාංශ වෙනස්වීම, අමාත්‍යාංශ විෂය පථය සංශෝධනය වීම, අමාත්‍යාංශ ලේකම්වරු පත් කිරීම වැනි ගැටළු හේතුවෙන් සැලසුම් කළ පරිදි අමාත්‍යාංශවල අභ්‍යන්තර විගණන කටයුතු සමාලෝචනය අවසන් කිරීමට නොහැකි වූ අතර, අමාත්‍යාංශ 07ක සමාලෝචන කටයුතු සිදු කරන ලදී. ඒ සඳහා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු 06ක්ද සහභාගී විය.

➢ නවක අභ්‍යන්තර විගණක නිලධාරී දැනුවත් කිරීම.

අමාත්‍යාංශ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමාලෝචනයේදී හඳුනාගන්නා ලද මූලික කරුණක් ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් හා අභ්‍යන්තර විගණකවරුන් ලෙස නව පත්වීම් ලබා ගත් නිලධාරීන් සඳහා සිය කටයුතු ක්‍රමවත්ව කර ගෙන යාම සඳහා අවශ්‍ය මූලික දැනුම ලබා දීමේ අරමුණින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්රික් ලේකම් කාර්යාලවල සේවයේ නියුතු නවක ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්හට එදිනෙදා පැවරී ඇති රාජකාරී කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය මගපෙන්වීම හා ඒවා ක්‍රමවත්ව පවත්වා ගෙන යාම සිදු කළ යුතු ආකාරය පිළිබඳ මූලික දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018.06.28 දින සංවිධානය කර පවත්වන ලදී. මේ සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරු 22දෙනෙකු සහභාගී විය.

➢ අභ්‍යන්තර විගණනය කටයුතු ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් සිදු කරන ලද වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ පවතින අභ්‍යන්තර විගණන ක්‍රමවේදයන් අධ්‍යනය කර අවශ්‍ය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නියෝජිතයින් පිරිසක් මඟින් සිදු කරන ලද අධ්‍යනය සඳහා රාජ්‍ය අංශය තුළ අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ වගකීම දරන ආයතනය ලෙස අවශ්‍ය තොරතුරු ලබා දීමත්, ඒ සඳහා අමාත්‍යාංශ මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සම්බන්ධීකරණයක් මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලදී.

එහිදී රේඛීය අමාත්‍යාංශවල පවතින අභ්‍යන්තර විගණන කටයුතු පිළිබඳ අධ්‍යනය සඳහා අමාත්‍යාංශ 03ක ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය, අධ්‍යාපන, සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය) සමඟ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට කටයුතු සංවිධානය කිරීම මෙන්ම, ආයතනික තීරණ ගැනීමේ ක්‍රියාවලියට අභ්‍යන්තර විගණයෙන් ලබා දෙන නිර්දේශවල ඇති වැදගත්කම පිළිබඳ අධ්‍යනය සඳහා උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් සමඟ සාකච්ඡාවක් පැවැත්වීමටත් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

3.5 සංවර්ධන ව්‍යාපෘතිවල කළමනාකරණ විගණනය ශක්තිමත් කිරීම.

3.5.1 විදේශ මූල්‍යනය සහිත සංවර්ධන ව්‍යාපෘති

සංවිධානයක උපාය මාර්ගික අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යපෘති කළමනාකරණයේ දී "අභ්‍යන්තර විගණනය" ඉතා සුවිශේෂී කාර්යයභාරයක් ඉටු කරනු ලබයි. ඒ අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව ***විදේශ මූල්‍යනය සහිතව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති*** සම්බන්ධයෙන් ඒවායේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා ද අවධානය යොමු කරමින් පියවර රාශියක් ගෙන ඇත.

එහිදී විශේෂයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම මඟින් ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීමත්, ප්‍රතිලාභී ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා කරදීමත්, ආර්ථික පිරිමැසුම් සහිතව ව්‍යාපෘති අරමුදල් යෙදවීමත් මඟින් නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමත් ඉලක්ක කෙරිණි.

ඒ අනුව, ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය ආයතනගත කිරීම හා බලගැන්වීම පිණිස ජාතික විගණන පනත හා මුදල් රෙගුලාසි සංග්‍රහයේ සලසා ඇති ප්‍රතිපාදන උපයෝගි කර ගනිමින් ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය; ව්‍යාපෘති මෙහෙයුම් ක්‍රියාවලිය හා සමගාමීව ක්‍රියාවේ යෙදවීම පිණිස කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මතු සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරුන් බඳවා ගැනීම බලගැන්වීම පිණිස කළමනාකරණ විගණන චක්‍රලේඛ 2/2016 නිකුත් කිරීම.
- ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය විධිමත් කිරීම සඳහා කළමනාකරණ විගණන චක්‍රලේඛ 1/2017 මඟින් මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- ව්‍යාපෘති අභ්‍යන්තර කටයුතු ඵලදායී අන්දමින් ඉටු කර ගැනීම සඳහා ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරුන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ කාර්යසාධනය සම්බන්ධයෙන් පසු විපරම් කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා තුළින් අනාවරණය කෙරෙන විශේෂ කරුණු සම්බන්ධයෙන් අවශ්‍යතාවය පරිදි වැඩිදුර විමර්ශන සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම ලබා දීම.
- ඇ.ඩො. මිලියන 10 ට අඩු විදේශීය මූල්‍යනය සහිත ව්‍යාපෘති සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම උදෙසා එකී ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණන කටයුතු කෙරෙහි අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් යොමු කිරීම.

3.5.2 2018 වර්ෂය තුළ ඉලක්ක සපුරා ගැනීම්

3.5.2.1 *ව්‍යාපෘති අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම*

DMA 2/2016 කළමනාකරණ විගණන චක්‍රලේඛය නිකුත් කරමින් ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරුවන් විදේශ මූල්‍යනය සහිත සංවර්ධන ව්‍යාපෘති සඳහා බඳවා ගැනීම පිණිස අවකාශ සලසාදීම ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමට ගන්නා ලද සුවිශේෂී පියවරකි. එමඟින් මුළු ව්‍යාපෘති පිරිවැය ඇ.ඩො. මිලියන 10 ඉක්ම වූ විදේශ මූල්‍යනය සහිත සෑම ව්‍යාපෘතියක් සඳහාම අභ්‍යන්තර විගණකවරයෙකු ව්‍යාපෘති නිත්‍ය කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට අවකාශ සැලසිනි. ඒ අනුව දැනට ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරුන් 28 ක් සේවයේ නියුක්තව ඇත.

මේ හැරුණු විට ව්‍යාපෘති කාර්යසාධනය ඉහළ නැංවීම හා කළමනාකරණ සංවර්ධනය සඳහා අභ්‍යන්තර විගණනය ඵලදායී ලෙස ඉවහල් කර ගැනීම පිණිස මතු සඳහන් ක්‍රියාමාර්ග දෙපාර්තමේන්තුව ගෙන ඇත.

1. උපාය මාර්ගික අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දායකත්වයක් අභ්‍යන්තර විගණකවරුන්ගෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ලබාදීම සහතික කිරීම පිණිස අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්යසාධනය පිළිබඳ කාර්තුමය ප්‍රගතිය විමසා බැලීම හා කාර්යසාධනය සම්බන්ධයෙන් පවතින ගැටළු හා ප්‍රශ්න සාකච්ඡා කරමින් සුදුසු විසඳුම් ක්‍රියාමාර්ග ගැනීම පිණිස විශේෂ ප්‍රගති විමර්ශන රැස්වීම් පැවැත්වීම.
2. ව්‍යාපෘති වත්කම් කළමනාකරණය විධිමත් කිරීමේ පූර්ව පියවරක් ලෙස දේශීය හා විදේශ මූල්‍යනය සහිත ව්‍යාපෘති සඳහා භාවිතා කරනු ලබන වාහන පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම හා ඒ අනුව ව්‍යාපෘති අවසානයේදී විධිමත් ලෙස එම වත්කම් පවරන්නේ ද යන්න පිළිබඳව මෙහෙයුම් හා පසුවිපරම් සිදු කිරීම.
3. සංවර්ධන ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් නිකුත් කර ඇති DMA/05 චක්‍රලේඛය යාවත්කාලීන කිරීම හා වැඩිදියුණු කිරීමට පියවර ගැනීම. (අදාළ කෙටුම්පත සකස් කර අවසන්)
4. අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීනත්වය, බලය සහ අධිකාරිත්වය මෙන්ම උපදේශනයේ ස්වාධීනත්වය ව්‍යාපෘති අභ්‍යන්තර විගණන මෙහෙයුම් ක්‍රියාවලියේ දී ව්‍යාපෘති අභ්‍යන්තර විගණකවරුන් වෙත ලබාදීම පිණිස ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීම හා ඒ හා සම්බන්ධව මාර්ගෝපදේශ ලිපි නිකුත් කිරීම.
5. ඇ.ඩො. මිලියන 10 ට අඩු විදේශ මූල්‍යන ව්‍යාපෘති විගණනය සඳහා අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන් යොමු කිරීම හා ප්‍රගතිය හා සම්බන්ධ පසු විපරම් කටයුතු සිදු කිරීම.

3.5.2.2 *ව්‍යාපෘති විශේෂ විමර්ශන*

සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව පහත සඳහන් විශේෂ විමර්ෂණ කටයුතු ද දැනට මෙම දෙපාර්තමේන්තුව විසින් අවසන් කර ඇත.

- කොළඹ දකුණු වරාය සංවර්ධන ව්‍යාපෘතියේ වාහන අවභාවිතය

3.6 විශේෂ විමර්ශන හා විගණන කටයුතු

3.6.1 විශේෂ විමර්ශන කටයුතු

මුදල් අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා වෙත මෙන්ම මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන පැමිණිලි මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ නියමය පරිදි පරීක්‍ෂා කර වාර්තා කිරිම සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබයි. එසේ යොමු කරනු ලදුව ඉටුකරන ලද පරීක්ෂණයන්ගේ වාර්තාවක් භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාට හෝ අදාළ ආයතනයේ ප්‍රධානීන්හට යොමු කරනු ලබන අතර, විමර්ශනය අනුව හෙළිදරව් වන අඩුපාඩු සහ අක්‍රමිකතා නැවත සිදුවීම වළක්වා ගැනීම මෙහි අරමුණ වේ.

2018 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විටදී කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මඟින් විමර්ශන කටයුතු අවසන් කර ඇති මුළු විමර්ශන සංඛ්‍යාව 18ක් වන අතර, මෙම කාලපරිච්ඡේදය තුළ ඉදිරිපත් වූ පැමිණිලි 11ක් සඳහා තවදුරටත් විමර්ශන සිදුකරමින් පවතී.

2018.12.31 දිනට අවසන් කර ඇති විශේෂ විමර්ශන

අනු අංකය	ආයතනය	විමර්ශනය
1	තැපැල් දෙපාර්තමේන්තුව	දිවයිනේ සියළුම තැපැල් කාර්යාල වල දූෂණයන්
2	තැපැල් දෙපාර්තමේන්තුව	තැපැල් දෙපාර්තමේන්තුවේ වංචා සහ අනුරාධපුර තැපැල් සංකීර්ණයේ දූර්වල පරිපාලනය හා මුදල් අවභාවිතය
3	ජාතික විද්‍යා සභාව	රාජ්‍ය මුදල් ගසා කෑම
4	ලංකා පුත්‍ර බැංකුව	ලංකා පුත්‍ර බැංකුවේ හම්බන්තොට ශාඛාවේ සිදු වී ඇති මූල්‍ය වංචා හා අක්‍රමිකතා
5	ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	ලේඛකාධිකාරීගේ දූෂණ හා වංචා පිළිබඳ
6	පුනරුත්ථාපන අමාත්‍යාංශය	පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරිමේ අමාත්‍යාංශයේ වංචා හා දූෂණ
7	කොළඹ වරාය ව්‍යාපෘතිය	ව්‍යාපෘතියට ගෙන යන වාහන සම්බන්ධව
8	ශ්‍රී ලංකා ධිවර වරාය නීතිගත සංස්ථාව	ජනතාවගේ මුදල් අයතා ලෙස ගසා කෑම
9	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව	කෑගල්ල ප්‍රාදේශිය ආදායම් කාර්යාලයේ ආදායම් ගෙවිමට නියමිත ව්‍යාපාරිකයින්ගේ ලිපි ගොනු මුදල් ලබා ගෙන ආයතනයෙන් ඉවත් කිරිම
10	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	නිල වාහන හිමිකම් නොලත් නිලධාරින් විසින් වාහන දීමනා ලබා ගෙන සිදු කරන රාජ්‍ය මුදල් අවභාවිතය පිළිබඳ
11	රේගු දෙපාර්තමේන්තුව	වාහන ඌන තක්සේරුව
12	සුරාබදු දෙපාර්තමේන්තුව	ප්‍රධාන සුරාබදු පරික්ෂක සම්බන්ධයෙන්
13	කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය	දූෂණ හා අක්‍රමිකතා හා රාජ්‍ය මුදල් අවභාවිතය
14	නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය	දූෂණ හා අක්‍රමිකතා
15	දුම්රිය දෙපාර්තමේන්තුව	දුම්රිය ගණකාධිකාරි විසින් අවධිමත් ගෙවීම් සිදු කිරිම
16	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව	නීති රීති උල්ලංඝණය කරමින් ක්‍රියා කිරීම
17	රේගු දෙපාර්තමේන්තුව	රත්තරන් කිලෝ 03ක් සම්බන්ධව විමර්ශන
18	වතු යටිතල පහසුකම් හා ග්‍රාමිය සංවර්ධන අමාත්‍යාංශය	නිසි ප්‍රසම්පාදන ක්‍රමවලින් තොරව භාණ්ඩාගාර මුදල් අවභාවිතය

2018.12.31 දින දක්වා ලැබී ඇති තවදුරටත් සිදුකරමින් පවතින විමර්ශන

අනු අංකය	ආයතනය	විමර්ශනය
1	තැපැල් දෙපාර්තමේන්තුව	යාපනය කාර්යාල අක්‍රමිකතා
2	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව	විමර්ශණ අංශයේ ජ්‍යේෂ්ඨ සහකාර කොමසාරිස් සම්බන්ධව
3	පෞද්ගලික සෞඛ්‍ය නියාමන සභාව	මහජන මුදල් අවභාවිතය හා බදු මුදල් පැහැර හැරීම පිළිබද පැමිණිල්ල
4	රේගු දෙපාර්තමේන්තුව	උසාවි නඩු අංක -AR-82/2017/(B)193/(17) රේගු ලිපි ගොනු අංකය - CIB/INV/108/2016
5	සෞඛ්‍ය අමාත්‍යාංශය	සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්ගේ (බෝනොවන රෝග) විෂමාචාර ක්‍රියා
6	ජාතික ජලසම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය	සක්‍රිය සේවා කාලයක් නොමැති වංචා සහගත ලෙස රාජ්‍ය සේවයේ මෝටර් රථ බල පත්‍ර ලබා ගැනීම
7	ලංකා ධිවර සංස්ථාව	ලංකා ධිවර සංස්ථාවේ සිදුවන දූෂණ පිළිබද වාර්තා කිරිම
8	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	රාජ්‍ය සේවක දේපල ණය මුදලේ රාජ්‍ය භාගය නොගෙවීම පිළිබද
9	තැපැල් දෙපාර්තමේන්තුව	තැපැල් දෙපාර්තමේන්තුවේ කෝටි ගණන් මුදල් වංචා යට ගැසීම හා විනය ක්‍රියාමාර්ග නොගැනීම
10	නාරා ආයතනය	කළමනාකරණයේ හා පරිපාලනයේ ඇති දූර්වලතා නිසා නාරා ආයතනය වර්තමානයේ පත්ව ඇති පරිහානිය සම්බන්ධව
11	ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය	අදාල සුදුසකම් සපුරා නොගත් නිලධාරින් බදවා ගැනීමේ ක්‍රියා පටිපාටියට පරිබාහිරව බදවා ගැනීම හා විශේෂ වරප්‍රසාද ලබා දීම

මෙම විමර්ශන කටයුතු 2018 වර්ෂය තුළ අවසන් කිරීමට නොහැකි වුවත්, ඒවායින් වැඩි ප්‍රමාණයක් අවසන් අදියර දක්වා නිමකර ඇත.

3.6.2 විශේෂ විගණන කටයුතු

රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් "B" ගිණුම විශේෂ විගණනය.

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "B" ගිණුමේ දිගුකලක් සිට පැවත එන නිරවුල් නොවූ ණය ශේෂ සම්බන්ධව විශේෂ විගණනයක් සිදු කරන ලදී.

ඒ සඳහා විවිධ රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ ආයතන හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත එවා ඇති 2017 වර්ෂයේ රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් "B" ගිණුම් 155ක දත්ත ඇතුළත් කරමින් දත්ත පද්ධතියක් සකස් කරන ලදී.

එම දත්ත නිරීක්ෂණය කර වර්ෂ 3කට අධික කාලයක සිට අය නොවූ හිඟ ශේෂ ඇති ආයතන වෙත, එම එක් එක් ණය ශේෂ නිරවුල් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර විමසා ලිපි යොමු කරන ලද අතර, රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 369 ප්‍රකාරව රු. 10,000/- නොඉක්මවූ ණය ශේෂ අත්හැර දැමීමේ බලය ප්‍රධාන ගණන්දීමේ නිළධාරියා වෙත පවරා ඇති බැවින්, එම චක්‍රලේඛ උපදෙස් පිළිපදිමින් අත්හැර දැමිය හැකි ණය ශේෂ 2018.12.31 දිනට ප්‍රථම කපා හැරීමට කටයුතු කරන ලෙස දන්වා අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කෙරිණි.

මෙම ලිපි සඳහා ආයතන 66කින් පිළිතුරු එවා ඇති අතර එම ආයතන විසින් ණය ශේෂ නිරවුල් කර ගැනීමට පහත පරිදි පියවර ගෙන ඇත.

කාරණය	මුදල
ගෙවා අවසන් කර ඇති ණය ශේෂ	රු. 8,565,275.59
නීතිමය කටයුතු සඳහා යොමු කර ඇති ණය ශේෂ	රු. 13,231,307.34
කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගත් සහ අනුමැතිය සඳහා යොමු කළ ණය ශේෂ	රු. 5,649,573.10
වාරික වශයෙන් අයකරමින් පවතින ණය ශේෂ	රු. 6,962,669.04
විනය පරීක්ෂණ නිසා මෙතෙක් අයකර ගත නොහැකි ණය ශේෂ	රු. 900,242.54

04. මානව සම්පත් කළමනාකරණය හා සාමාන්‍ය පරිපාලනය

4.1 2018.12.31 දිනට දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



කා.සේ.සේ. - 6   රියදුරු - 2

* ප්‍ර.රා.ක.ස. - ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර   * සං.නි. - සංවර්ධන නිලධාරී   * රා. ක.ස. - රාජ්‍ය කළමනාකරණ සහකාර

4.2 කාර්ය මණ්ඩලය

ජාතික විගණන පනතේ ප්‍රතිපාදන හා රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ අනුව මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පුළුල් වීම හේතුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1160/II හා **2018.08.03** දිනැති ලිපියට අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු දෙකක් යටපත් කරමින්, මෙම දෙපාර්තමේන්තුව සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී I ශ්‍රේණියේ අධ්‍යක්ෂ තනතුරු දෙකක් **(02)** ඇති කරන ලදී.

2018.12.31 දිනට කාර්ය මණ්ඩලය

තනතුර	සේවක සංඛ්‍යාව		
	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	01	01	-
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.)	01	**01**	-
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ග.සේ.)	**07**	**07**	-
අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍රි.සේ.)	02	02	-
සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ග.සේ.)	**05**	**04**	01
පර්යේෂණ සහකාර / සංවර්ධන නිලධාරී	09	08	**01**
රාජ්‍ය කළමනාකරණ සහකාර	14	14	-
රියදුරු	07	02	05
කාර්යාල සේවක සේවය	06	05	01
එකතුව	**53**	**45**	**08**

4.3 2018 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු

4.3.1 2018 වර්ෂයේ විදේශීය පුහුණු අවස්ථා

අනු අංකය	නිලධාරියාගේ නම	තනතුර	කාලසීමාව	පුහුණු වැඩසටහන	පුහුණුව ලද රට
1.	Mrs. M.A.K.P. Wijewantha	Director	16.01.2018 - 23.01.2018	International Programme on Management Auditing for the Public Sector International Auditors at Open University of Malaysia	Malaysia
2.	W. Wimalasena	Director	16.01.2018 - 23.01.2018	International Programme on Management Auditing for the Public Sector International Auditors at Open University of Malaysia	Malaysia
3.	H.M.S. Dharmawardane	Director	16.01.2018 - 23.01.2018	International Programme on Management Auditing for the Public Sector International Auditors at Open University of Malaysia	Malaysia
4.	W.M.D. Wijebandara	Assistsnt Director	16.01.2018 - 23.01.2018	International Programme on Management Auditing for the Public Sector International Auditors at Open University of Malaysia	Malaysia
5.	Ms. B.T.N. Mali	Assistsnt Director	16.01.2018 - 23.01.2018	International Programme on Management Auditing for the Public Sector International Auditors at Open University of Malaysia	Malaysia
6.	Ms. K.P.G.U. Kariyawasam	Assistsnt Director	16.01.2018 - 23.01.2018	International Programme on Management Auditing for the Public Sector International Auditors at Open University of Malaysia	Malaysia

7.	Mr.W.M.D. Wijebandara	Assistsnt Director	25.02.2018 - 04.03.2018	Workshop on Implementing Sustainable E- Government Solutions	Singapore
8.	Mrs. S.A.C. Kulathilaka	Director General	20.06.2018 - 23.06.2018	ACIIA 1st Regional Forum for Public Sector Internal Auditors	Philipine
9.	Mrs. J.H. Fernando	Deputy Director	12.08.2018 - 19.08.2018	Programme on Planning, Implement ion, Monitoring & Evaluation	Malaysia
10.	Mr. A.N. Hapugala	Director	02.09.2018 - 09.09.2018	International Programme on Management Auditing for the Public Sector Auditors From 02nd -09th September 2018 in Malaysia	Malaysia
11.	Mr. M.R.G.A.B. Muthukude	Director	02.09.2018 - 09.09.2018	International Programme on Management Auditing for the Public Sector Auditors From 02nd -09th September 2018 in Malaysia	Malaysia
12.	Mrs. V.I. Dilhani	Deputy Director	02.09.2018 - 09.09.2018	International Programme on Management Auditing for the Public Sector Auditors From 02nd -09th September 2018 in Malaysia	Malaysia
13.	Mrs. S.A.C. Kulathilaka	Director General	09.09.2018 - 14.09.2018	2018 Asian Evaluation week Making Evaluation work at the Country Level from 10-14 September	China
14.	Mrs. G.A.G.T. Ganepola	Assistant Director	09.09.2018 - 19.09.2018	Diploma in Public Procurement and Contract Administration Partial Fulfillment	Japan
15.	Mr. S.P.M.D. Wijewardane	Development officer	09.09.2018 - 27.09.2018	2018 Seminar on Paperless Trade and Cross-border E-Commerce for Asia-Pacific Countries from 09 to 27 September 2018 China	China
16.	Ms. W.K.P.H.N.S. Rodrigo	Development officer	09.09.2018 - 27.09.2018	2018 Seminar on Chinese Language for officials from Developing Countries from September 7 to 27 at Beijing Chinese Language and Culture College	China

17.	Mr. W. Wimalasena	Director	02.11.2018 - 15.11.2018	2018 Seminar on Trade Promotion of Asia Countries II	China
18.	Mrs. H.M.P.C. Kumarihamy	Director	26.11.2018 - 30.11.2018	Shanghai International Program for Development Evaluation Training (SHIPDET) Special Topic Course	China

4.3.2 2018 වර්ෂයේ දේශීය පුහුණු අවස්ථා

අනු අංකය	පුහුණු පාඨමාලාව/ වැඩසටහන	මෙහෙයවූ ආයතනය	පැවැත්වූ දිනය/ දිනයන්	සහභාගීවූ නිලධාරීන්ගේ නම් සහ තනතුරු
1.	දෙමළ භාෂා මූලික පුහුණුව	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2018.01.16 දින සිට සතියේ අඟහරුවා දින මාස 06 (පැය 03 ක කාලයක්)	ඩී. තුසිත් චන්දිම මයා - රාජ්‍ය කළමනාකරණ සහකාර
2.	දෙමළ භාෂා මූලික පුහුණුව	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2018.01.16 දින සිට සතියේ අඟහරුවා දින මාස 06 (පැය 03 ක කාලයක්)	එම්.ජී.එන්.එස්. මීගස්මුල්ල මිය - සංවර්ධන නිලධාරි
3.	දෙමළ භාෂා මූලික පුහුණුව	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2018.01.16 දින සිට සතියේ අඟහරුවා දින මාස 06 (පැය 03 ක කාලයක්)	එම්.ඩී.ආර්.පී. සුරංග මයා - කාර්යාල සේවක සේවය
4.	දෙමළ භාෂා මූලික පුහුණුව	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව	2018.01.16 දින සිට සතියේ අඟහරුවා දින මාස 06 (පැය 03 ක කාලයක්)	ඕ.කේ. තරිඳු තිලංක මයා - කාර්යාල සේවක සේවය
5.	දෙවන කාර්යක්ෂමතා කඩඉමට අදාල සම්මන්ත්‍රණය	SDFL	2018.01.06, 07 (දින 02)	නිම්මි ශිරෝමි රුද්‍රිගු මිය - සංවර්ධන නිලධාරි
6.	Project Management & Proposal Writing	මිලෝදා ආයතනය	2018.01.29 සහ 30 (දින 02)	නිම්මි ශිරෝනි රුද්‍රිගු මිය - සංවර්ධන නිලධාරි
7.	Project Management & Proposal Writing	මිලෝදා ආයතනය	2018.01.29 සහ 30 (දින 02)	එම්.ඩි.එස්.එස්.වීරසිංහ මිය - සංවර්ධන නිලධාරි
8.	Project Management & Proposal Writing	මිලෝදා ආයතනය	2018.01.29 සහ 30 (දින 02)	ජේ.පී. මුදලිගේ මයා - රාජ්‍ය කළමනාකරණ සහකාර

9.	Financial Regulations in the Public Sector	මිලෝදා ආයතනය	2018.02.07 සහ 08 (දින 02)	කේ.ඒ.අයි. මායාදුන්න මිය - රාජ්‍ය කළමනාකරණ සහකාර
10.	Financial Regulations in the Public Sector	මිලෝදා ආයතනය	2018.02.21, 22, 23 (දින 03)	එම්.ඒ. කුසුමලතා මිය - රාජ්‍ය කළමනාකරණ සහකාර
11.	Computerized Government Payroll System	මිලෝදා ආයතනය	2018.02.26, 27, 28 (දින 03)	එම්.ඩබ්.ඒ.එස්. ශාන්තමාලි මිය - රාජ්‍ය කළමනාකරණ සහකාර
12.	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයට අදාල පුහුණුව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කොළඹ	04-14 සැප්තැම්බර් 2018	ඩබ්.ඒ.පී.ඩී. විතානාරච්චි මිය - රාජ්‍ය කළමනාකරණ සහකාර
13.	Public Speaking Skills	මිලෝදා ආයතනය	26-28 සැප්තැම්බර් 2018	එච්.එම්.පී.සී. කුමාරිහාමි මිය - අධ්‍යක්ෂ

05. 2019 වර්ෂය සඳහා යෝජිත ක්‍රියාකාරකම්

1. අභ්‍යන්තර විගණනයට අදාලව නව මාර්ගෝපදේශ නිකුත්කිරීම හා දැනට නිකුත් කර ඇති මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම

1. මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණනයට අදාළව මාර්ගෝපදේශ 07 ක් නිකුත් කර ඇති අතර, එම මාර්ගෝපදේශ යාවත්කාලීන කර සංශෝධිත මාර්ගෝපදේශ නිකුත්කිරීමේ අවශ්‍යතාවය පෙනියන බැවින් පහත සඳහන් මාර්ගෝපදේශ 02 2019 වර්ෂයට අදාළව සංශෝධනය කිරීමට අපේක්ෂිතය.
   - (i) 2009/06/09 දිනැතිව අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශය සම්බන්ධයෙන් නිකුත් කර ඇති DMA/2009(1) මාර්ගෝපදේශය (කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01-2019 වශයෙන් 2019.01.12 දිනෙන් නව චක්‍රලේඛයක් ලෙස නිකුත් ඇත.)
   - (ii) 2010/07/26 දිනැතිව විදේශ මූලනය සහිත ව්‍යාපෘති අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද DMA/2010(5) මාර්ගෝපදේශය
2. අභ්‍යන්තර විගණන කාර්යය වඩාත් ඵලදායිව ඒකීය ක්‍රමයකට ඉටුකරවා ගැනීමේ අරමුණින් පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළව නව මාර්ගෝපදේශ හා පිරික්සුම් ලැයිස්තු (check list) හඳුන්වාදීමට නියමිතය.

❖ නව මාර්ගෝපදේශ නිකුත්කිරීම

- (i) විශේෂ විමර්ශන පැවැත්වීම සඳහා මාර්ගෝපදේශයක් හඳුන්වාදීම.
- (ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණනය සම්බන්ධව මාර්ගෝපදේශයක් හඳුන්වාදීම
- (iii) ක්‍රියාවලීන් සහ පරිගණක ආශ්‍රිත ක්‍රියාවලි විගණනය පදනම් කරගනිමින් පද්ධති විගණනයට මාර්ගෝපදේශ හඳුන්වාදීම

❖ **පිරික්සුම්** ලැයිස්තු නිකුත්කිරීම

- (i) වවුචර් සංනිරීක්ෂණය කිරීමේ පිරික්සුම් ලැයිස්තු
- (ii) පුද්ගලික ලිපිගොනු විගණන පිරික්සුම් ලැයිස්තු
- (iii) රජයේ වැටුප් ගෙවීම සම්බන්ධ පද්ධති (GPS) විගණන පිරික්සුම් ලැයිස්තු

2. පළාත් සභා හා පළාත්පාලන ආයතනවල අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම.

දැනට මෙම දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකකවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල අභ්‍යන්තර විගණන ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරී ලෙස සහභාගී වුවද පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතුවලට මැදිහත්වීමක් සිදු නොකෙරේ. එහෙත් මෙම ආයතනවල ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන/ අග්‍රිම ලබාදෙන අතර, එම පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් ද ඉතා විශාල මුදල් ප්‍රමාණයක් ඒ සඳහා වියදම් දරනු ලබයි. එබැවින් එම ආයතනවල ශක්තිමත් අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව විසින් පෙන්වා දුන් අතර, ඊට අනුකූලව මෙම දෙපාර්තමේන්තුව විසින් එම ක්‍රමවේදය සකස් කළ යුතු බවට උපදෙස් ලබාදෙන ලදී. ඒ අනුව 2019 වර්ෂයේදී පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීමේ අරමුණින් පහත සඳහන් කාර්යයන් ඉටුකිරීමට සැලසුම් කර ඇත.

1. පළාත් පාලන ආයතනවල අභ්‍යන්තර විගණන ඒකක පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම.
2. පළාත් පාලන බලධාරින්ට විශේෂයෙන් අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

3. අභ්‍යන්තර විගණන වාර්තා පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් සැකසීම.

ජාතික විගණන පනතේ 40(3) වගන්තිය යටතේ අභ්‍යන්තර විගණකවරුන් විසින් ඉදිරිපත් කරනු ලැබූ සියලු වාර්තාවල පිටපත් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතුය. ඒ අනුව මෙම සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවලින් පැන නැගෙන අභ්‍යන්තර විගණන නිරීක්ෂණයන් හා එකී නිර්දේශ එම ආයතන විසින් ගනු ලබන ක්‍රියාමාර්ග පසුවිපරම් කිරීමේ ක්‍රමවේදයක් 2019 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.